මගේ අංකය / எனது இல. / My No. DoP/Media/PR

ඔබේ අංකය / உமது இல. / Your No. ……………………

දිනය / திகதி / Date 2023.01.02

<u>මාධ්‍ය නිවේදනයයි</u>

**විශ්‍රාමික ජීවිත සහතික ලබා දීම-2023**

ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ගේ මාසික විශ්‍රාම වැටුප අඛණ්ඩව හා නිවැරදිව ලබා දීමේ දී පවත්නා රෙගුලාසිවලට අනුකූලව සෑම වසරකම පදිංචිය හා ජීවත්ව සිටින බවට තහවුරු කර ගැනීම සඳහා ජීවිත සහතික ලබා ගැනීම සිදු කෙරෙයි.

02. 2023 වර්ෂය සඳහා ජීවිත සහතික ලබා ගැනීම මේ වන විට ආරම්භ කර ඇති අතර එක් එක් විශ්‍රාමිකයන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ ක්‍රමවේදය වෙනුවට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින්· සියලුම විශ්‍රාමිකයන්ට එක් ආකෘති පත්‍රයක් ඔස්සේ ජීවිත සහතික තහවුරු කිරීමේ අවස්ථාව ලබා දී ඇත. එහි දී විශ්‍රාමිකයන්ට තමන් ජීවත් වන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කාර්යාලයට පැමිණ හැඳුනුම්පත ඉදිරිපත් කර තම අනන්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව අදාළ ආකෘතියෙහි තමන්ට අදාළ ස්ථානයෙහි සිය ජීවිත සහතිකය තහවුරු කිරීමේ අවස්ථාව හිමි වේ.

03. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සිට විශ්‍රාමිකයන්ගේ ඇඟිලි සලකුණ ලියාපදිංචි කිරීම සිදු කළ අතර එසේ ඇඟිලි සලකුණු ලියාපදිංචි කර ඇති විශ්‍රාමිකයන් 2019 වර්ෂයේ සිට ආරම්භ කර ඇති ජීවිත සහතික ඇඟිලි සලකුණ මඟින් ලබා දීමේ ක්‍රමවේදය මඟින්ම සිය ජීවිත සහතිකය යාවත්කාලීන කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26 ක් සහ රාජ්‍ය හා පෞද්ගලික බැංකු 6 ක ශාඛා 476 ක් ඔස්සේ ඒ සඳහා පහසුකම් ලබා දීමට ද කටයුතු යොදා තිබේ.

04. ඇඟිලි සලකුණ තහවුරු කිරීමේ පහසුකම උපයෝගී කර ගනිමින් තම ජීවිත සහතික ලබා දීමේ හැකියාව ඇති විශ්‍රාමිකයන් වෙත ඒ බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ ජංගම දූරකථනයට කෙටි පණිවුඩයක් එවා දැනුම්වත් කෙරෙනු ඇත.

05. මෙම ක්‍රමවේද ඔස්සේ සියලු විශ්‍රාමිකයන් 2023.03.31 දිනට සිය ජීවිත සහතික යාවත්කාලීන කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

06. ඇඟිලි සලකුණ මඟින් ජීවිත සහතික ලබා දීම සඳහා ලියාපදිංචි වී ඇති බව

www.pensions.gov.lk → Public Services → Digital Life Certificate Information
වෙත පිවිසීමෙන් විශ්‍රාමිකයාටම දැන ගැනීමේ හැකියාව ද මේ වන විට පවතී.

07. එසේම ඇඟිලි සලකුණු මගින් ජීවිත සහතිකය තහවුරු කළ හැකි බැංකු ශාඛා 476 හි නාම ලේඛනය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26ක නාම ලේඛනය භාෂාත්‍රයෙන් පහත පරිදි බාගත කරගත හැකිය.

www.pensions.gov.lk → Resources → Downloads → Life Certificate-2023 through Finger Prints from 01.01.2023

08. මෙම කටයුතු සාර්ථක කරගැනීම පිණිස "විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023 ග්‍රාම නිලධාරීන්ට උපදෙස් ලබා දීම" මැයෙන් යුතුව අංක HA/3/3/10-2 හා 2022.12.08 දිනැතිව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වරයා විසින් උපදෙස් මාලාවක් නිකුත් කර ඇත.

ජේ.ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්